බලංගොඩ ප්‍රාදේශීය සභාව

**රත්නපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 17 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපැම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලොචිත වර්ෂය තුලදී එකතුව රු.2,440,866 ක්වූ ඉදිකිරීම් වල අගය ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛණයෙහි ඇතුලත් සභාව සතු ඉඩම් 12 කට අදාල වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සභාව විසින් ඉදිකරන ලද 2013 වර්ෂයේ සිට භාවිතා කරන ආදාහනාගාරයේ පිරිවැය වූ රු.8,391,146 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) බෙදා හැරීම සඳහා මිල දී ගෙන තිබූ තොග ලේඛනයේ සටහන් කර ඇති වටිනාකම රු.75,350 ක් වූ සී.එෆ්.එල්.බල්බ හා ප්ලාස්ටික් පුටු අවසන් තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට ලැබිය යුතු හිඟ හිටි ජල ගාස්තු රු.14,440 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් පදිංචිය සඳහා බදු දී ඇති යකහලු මුකලාන ප්‍රදේශයේ බිම් කට්ටි19 ක් වෙනුවෙන් අයවිය යුතු කුලී රු.38,200ක් අය කර ගැනීමට විගනිත දිනය වූ 2016අප්‍රේල්07 දින දක්වා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) දේශීය අදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු එකතුව රු.247,767 ක් වූ එකතු කල අගය මත බදු සහ සියයට තුනක ජාතිය ගොඩනැගීමේ බදු විගණිත දිනය වූ2016 අප්‍රේල් 07 දින වන වන විටත් ප්‍රේෂණය නොකර විවිධ තැන්පතු ගිණුමේ රදවාගෙන තිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.1,949,259ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4. **නිතී රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සදහන් අනුකූල නොවීම් විගණනයේ දී කරනු ලැබේ.

| නිතී රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) සබරගමුව පළාතේ පළාත් සභාවේ මුල්‍ය රීතී සංග්‍රහය | |
| (i). 261.2.7 රීතීය | 1992 වර්ෂයේ සිට නිකුත් කරන ලද එකතුව රු.472,884 ක අතුරු අග්‍රිම විගණිත දිනය වූ 2016 අප්‍රේල්07 දින දකවා පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii). 283 රීතීය | එකතුව රු.8,999 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත්8ක් සම්බන්ධයෙන් එකී රීතී ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ). 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීතී | |
| (i) 214 රීතීය | 2015 දෙසැම්බර් 31 දිනට රු.415,370 ක් වටිනා ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(8) මාර්ගෝපදේශය | ප්‍රාදේශිය සභාවවිසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රෙල්ඛය | සභාව සතුව පවතින රු.532,580 ක් වටිනා පරිගණක හා පරිගණක උපාංග වත්කම් ලේඛණයක ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2015 ජුලි 23 දිනැති අංක 07/2015 දරණ විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛය | සභාවේ සේවයේ නියුතු සේවකයන් දෙදෙනෙකුට අදාලරු.77,700 ක් වූ දායකමුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීම් සිදුනොකර ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් පාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදලට ගෙවාතිබූ බව නිරීක්ෂණය විය. |
| (ඊ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | සභාවේ 52 දෙදෙනෙකුගෙන් සමන්විතකාර්ය මණ්ඩලයක් සිටියද පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රයක් භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමටවඩා වැඩි වූ ආදායම රු. 3,579,926 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදමටවඩා වැඩි වූ පුනරාවර්තන ආදායමරු.2,657,594 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.922,332 ක වර්ධනයක් ඇති වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු. 6,322,668 කින් වැඩි වීමත්, ගමන් වියදම්සහ සැපයුම් උපකරණ වියදම රු.2,437,278කින් අඩු වී තිබීමත්ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 වරිපනම් බදු

--------------

ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් බදු රු.239,695 ක ශේෂයකින් රු.207,789 ක් එනම් සියයට 87 ක් අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.3.2 බදු කුලී

---------

ඉකුත් වර්ෂය සඳහා හිඟව තිබූ අක්කර බදු රු.31,115 ක ශේෂයකින් රු.25,871 ක් එනම් සියයට 83 ක් සහ සමාලෝචිත වර්ෂයේ අයවැයගත අක්කර බදු රු.27,707 කින්රු.13,555ක් එනම් සියයට 49 ක් අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.3.3 මුද්දර ගාස්තු

----------------

2014වර්ෂයේ සැප්තැම්බර් සිට 2015 වර්ෂයේ දෙසැම්බර් දක්වා ලැබිය යුතු රු.5,280,100 ක මුද්දර ගාස්තු සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 07 දින දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

3.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාවට ලැබී තිබූ වාහන සහ යන්ත්‍ර 06 ක් සම්බන්ධයෙන් හිමිකම සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2. කොන්ත්‍රාත් පාලනය

-------------------------

අදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගම විසින් 2013 අප්‍රේල් 09 දින සභාව වෙත ඉදිරිපත් කර තබු රු.4,194,270 ක් වූ අවසන් බිල්පත පරික්ෂා කර ගෙවීම් කිරීමට විගණිත දිනය වූ 2016 අප්‍රේල් 07 දින දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

සභාව මගින් ගොඩ කුඹුර ග්‍රාම නිලධාරි වසමේ අනිච්චියාවත්ත හේන නැමති ස්ථානයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් ගෙන් අක්කරයක ඉඩමක් රු.22,600 ක වාර්ෂික බදු පදනම මත ලබාගෙන තිබුණද,විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර ඉදිකිරීම් ආරම්භ කිරීම නිසා ඒ වෙනුවෙන් දරන ලද රු.74,772ක මූලික වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

**නිෂ්ක්‍රීය වත්කම්**

------------------

එකතුව රු.14,514,918ක් වූ සභාවේ වාහන හා යන්ත්‍ර උපකරණ වර්ෂයකට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව තිබූ බව නිරීක්ෂණය විය.

04. **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම් සහ තත්‍ය වියදම් සැසඳීමේ දී පුනරාවර්තන වියදම් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 21 සිට සියයට 69 දක්වා වූ විචලනයක් ද, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 36 සිට සියයට 87දක්වා විචලනයක් ද නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

05. **පද්ධති හා පාලනයන්**

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගබඩා පාලනය

(ඈ) අයවැය පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) වත්කම් කළමනාකරණය